www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මෙම වසරේ ලෝක ආර්ථිකය සියයට එකකින් පහත වැටෙන බව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කියයි

## IMF report: World economy to shrink 1 percent this year

**2009 මාර්තු 20**

**ඇන්ඩ්‍රි ඩැමෝන් විසිනි**

මෙම වසරේ ලෝක ආර්ථික වර්ධනය පිලිබඳ සිය තක්සේරුව කපාහරිමින් හා 2008 වසරේ අවසන් භාගයේ ලෝක ආර්ථිකය, පශ්චාත් යුද්ධ අවධියේ වාර්තාගත තියුනුම ප්‍රතිශතයකින් හැකිලී ගිය බව දැක්වෙන, තැති ගන්වන සුලු සංඛ්‍යාවන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජාමූඅ) විසින් මාර්තු 19 දින ප්‍රසිද්ධියට පත් කලේය. අවසාන කාර්තුවේ දී සියයට 5 වාර්ෂික ප්‍රතිශතයකින් ලෝක ආර්ථිකයේ ඇතිවූ හැකිලීමෙන් පසුව, 2009 දී එය සියයට 1 දක්වා ප්‍රමානයකින් සංකෝචනය වනු ඇතැයි ජාමූඅ අපේක්ෂා කරයි.

*ගෝලීය ආර්ථික ප්‍රතිපත්ති හා ශක්‍යතා* නමින් යුත් වාර්තාව වීලියෙල කර තිබුනේ පසුගිය සති අන්තයේ ලංඩන්හි පැවති ජී 20 රැස්වීමට පෙරාතුව ය. බිඳ වැටෙන වෙලඳම, උමතු සහගත මූල්‍ය උච්ඡාවචන, සිඳීයන ප්‍රාග්ධන ගලායාම් හා බෙහෝ ආන්ඩු සිය එදිනෙදා කටයුතුවලට අවශ්‍ය මුදල් සපයාගැනීමේ ගැටලුවට මුහුනපා සිටින තත්වය හමුවේ ලෝක ආර්ථිකය කැලඹීම්වලින් ඉරිතලා ඇතැයි එහි සඳහන් වේ.

මේ මාසය තුල ලෝක බැංකුව විසින් නිකුත් කල ප්‍රකාශය දෝංකාර නංවමින් ජාමූඅ වාර්තාව සටහන් කරන්නේ, ''හැට වසරකට පසුව ප්‍රථම වතාවට 2009 දී ගෝලීය ක්‍රියාකාරිත්වය හැකිලී යනු ඇතැයි අපේක්ෂා කෙරේ.'' යනුවෙනි. එය මෙම වසරේදී සියයට 0.5-0.1 වනු ඇතැයි එය අනාවැකි පල කරයි.

ජනවාරියේ දී ජාමූඅ ගෝලීය වර්ධනය පිලිබඳ සිය අනාවැකිය සියයට 0.05 දක්වා කපා හැරියේය. එතැන් සිට තෙමසක් ගතවූ තැන ජාමූඅ තක්සේරුව 1 සිට 1.5 දක්වා ප්‍රතිශතයකින් කැපී ගොසිනි. සැබවින්ම, අර්බුදය පටන් ගත් තැන් සිට, ගෝලීය වර්ධනය පිලිබඳව ඕනෑවට වඩා ඉහල අගයක් දැරූ සියලු ගනන් බැලීම්, තියුනු ලෙස පිරිහෙන ආර්ථික තත්වයන් හමුවේ නිරතුරුව පහත හෙලීමට සිදුවිය.

ආර්ථික වැටීමෙන් අපනයන මත පදනම්ව සිටින ජාතීන් දරුනු ලෙස බැටකමින් සිටින තතු හමුවේ වාර්තාව, වෙලඳාමේ ගෝලීය පරිමාන බිඳ වැටීම පෙරමුනට ම ගෙන තිබේ. ජර්මනිය හා ජපානය, පිලිවෙලින් ලෝකයේ ලොකුම හා හතරවන ලොකුම අපනයනකරුවන් වන අතර එම රටවල ආර්ථිකයන් අවසන් කාර්තුවේ දී සියයට 6.1 පිරිහී ගියේ එක්සත් ජනපදයට ද වඩා වැඩි පීඩාවකට මුහුන දෙමින් ය.

සිව්වන කාර්තුවේ දී සියයට 13 වාර්ෂික ප්‍රතිශතයකින් ආර්ථික සංකෝචනයකට මුහුනපෑ ජපානය මේ වසර තුල වඩාත්ම නරක ප්‍රතිපල පෙන්වන රටවල් අතර සිටින බව සඳහන් කරන වාර්තාව. වසරේ ආර්ථික හැකිලීම සියයට 5.8 වන බවට ගනන් බලා ඇත. යුරෝ කලාපය සියයට 3.2 හා එක්සත් ජනපදය සියයට 2.6 ආර්ථික පසුබෑමකට මුහුන දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ජී7 ප්‍රමුඛ ආර්ථිකයන් සමස්ත පශ්චාත් යුද කාලපරිච්ඡේදයේ තියුනුම පිරිහීමට මුහුන දෙනු ඇතැයි අපේක්ෂිතය. දියුනු ආර්ථිකයන්හි සිව්වෙනි කාර්තුවේ දල දේශීය නිෂ්පාදිතයෙහි (දදේනි) හැකිලීම සියයට 7 ක් විය.

> ''සමස්ත ආර්ථිකයෙහි ඇන හිටීමත්, මූල්‍ය අංශයේ දූෂිත භාවය තව තවත් උග්‍රවෙද්දී හා 2010 මැද භාගයට පෙර ගොඩඒමක් සිදුවනු ඇති බවට පැවති විශ්වාසය තුනීවී යාමත් අතර අන්‍යොන්‍යව ගොඩනැඟෙන යලි පනගැන්වීම පිලිබඳ අශුභවාදය දලුලයි. පෙරදැකීමෙහි පහතට නැඹුරුවූ සැලකිය යුතු සංශෝධනයක් තිබියේ වී නමුත් යටි නැඹුරුවේ අවදානම දිගටම පවතිනු ඇත.''

වෙනත් වචන වලින් කිවහොත්, ඉක්මන් පනගැන්වීමක් පිලිබඳ බලාපෙරොත්තු මන්දගාමී වන අතර නව මහා අවපාතයක අවදානම සැලකිය යුතු තරම් ය.

එක්සත් ජනපද කම්කරු දෙපාර්තමේන්තුව 19 වන දින නිකුත් කල වාර්තාවකට අනුව දිගටම විරැකියා දීමනා ලබාගන්නා පුද්ගලයන්ගේ සංඛ්‍යාව පසුගිය සතියේ දී වාර්තාගත මට්ටමකට ඉහල ගියේය. 185,000 දක්වා ඉහල නැගුනු සංඛ්‍යාව මිලියන 5.47 ක් ලෙස වාර්තා විය. ජනගහන වර්ධනයට ගැලපීම් කර නැති මෙම සංඛ්‍යා, වාර්තා තැබීම ආරම්භ කල 1967 පසු ඉහලම මට්ටමයි.

වසරකට පෙර 375,000 වූ නව විරැකියා දීමනාවන් ඉල්ලුම් කිරීම, මාර්තු මුල් සතියේ දී 658,000 දක්වා ඉහල ගියේය. බොහෝකොට ම සංඛ්‍යාලේඛන දෝෂ පිලිබිඹු කරමින් පසුගිය සතියේ දී සංඛ්‍යාව 12,000 න් පහත වැටුනි.

රැකියා අහිමිවීමේ දීමනා ඉල්ලුම් කිරීමේ මාසික සාමාන්‍යය ද මෙම සතියේ දී 1982 පසු එහි ඉහලම මට්ටමට නැගුනි. මෙම සංඛ්‍යාව පෙර සති හතරේ සාමාන්‍යය වූ 651,000 සිට 654,750 තෙක් ඉහල ගියේය. ආර්ථික විද්‍යාඥයන් දැන් පුලුල් ලෙස දක්වන්නේ එය මේ මාසයේ දී 700,000 දක්වාත් එලඹෙන මාසවල දී මිලියනයක් දක්වාත් ඉහල යනු ඇති බවය. ''රැකියා නියුක්තියේ යටි නැඹුරුවෙහි තාවකාලික හෝ තුරල් වීමක් පිලිබඳ සලකුනක් පවා දක්නට නැතැයි'' අධි සංඛ්‍යාත අර්ථශාස්ත්‍රඥයන්ගේ ඉයන් ස්ටෙෆර්ඩ්සන් ප්‍රකාශ කරයි. එක දිගට හය ලක්ෂයකට වඩා රැකියා අහෝසි කල සිව්වන මාසය වූ පෙබරවාරියේ දී එය 651,000 විය. වඩාත් නිවැරදිව කිව හොත් මෙවැන්නක් අවසන් වරට සිදුව ඇත්තේ මහා අවපාතයේ අවසන් අදියරේදී ය.

වර්තමානයේ පවතින විරැකියා අනුපාතය වන සියයට 8.1, 1983 පසු ඉහලම අගයයි. නිල විරැකියා අනුපාතයට ඇතුලත් වන්නේ සැබෑවට ම වැඩක් සොයමින් සිටින මිනිසුන් පමනි. අනියම් හා රැකියා සෙවීම ''එපාවී සිටින'' කම්කරුවන් ද මීට ඇතුලත් කල හොත් අනුපාතය සියයට 14.8 වනු ඇත. එය වසරකට පෙර තිබුනාට වඩා සියයට 6 වැඩි අනුපාතයකි.

එක්සත් ජනපදයේ නිල විරැකියා සංඛ්‍යාලේඛන නොයෙකුත් අංශවල දැඩි විවේචනයට ලක්ව ඇත. නිදසුනක් ලෙස ආර්ථික බුද්ධි මන්ඩලයක් වන ආර්ථික ප්‍රතිපත්ති පර්යේෂන මධ්‍යස්ථානය ප්‍රකාශ කරන්නේ 1982 ක්‍රමවේදයන් අනුව මනින්නේ නම් විරැකියා අනුපාතයේ පාද ලාංඡනය සැලකිය යුතු තරමින් ඉහල අගයක් ගනු ඇති බවයි.

> ''ඇපල් ගෙඩියකට ඇපල් ගෙඩියක් සමානය යන පදනමෙන් ගතහොත් අද දිනයේ විරැකියා අනුපාතය සියයට 8.1 සිට 9.5 දක්වා වැඩි විය යුතුය. එය 1982 සාමාන්‍යය වූ සියයට 9.7 ට යන්තම් සියයට 0.2 ක් පමනක් අඩු ප්‍රමානයකි'' යයි එම සංවිධානයේ ජෝන් ස්කිමිට් ප්‍රකාශ කලේය.

ෂැඩොස්ටැට්ස් ඩොට්කොම් හි ජෝන් විලියම්ස් ඊටත් එහා යමින් කියා සිටින්නේ සියයට 25 ක් වූ මහා අවපාතයේ විරැකියා අනුපාතය ගනනය කල මිම් අද දිනයට යොදා ගන්නේ නම් වර්තමාන විරැකියා අනුපාතය සියයට 19.1 වනු ඇති බවත්, එය 1930 ගනන්වලට සමීප වෙමින් පවතින බවත් ය.

© www.wsws.org